ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

60 | S | I,II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2012 ජූලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2012
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2012

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
I, II
Business and Accounting Studies I, II

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

- ❖ පළමුවන ප්‍රශ්නය ඇතුලුව සියලු ම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
- ❖ පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

---

01. "රෙඩිවෙයාර් ගාමන්ට්" ඇඟළුම් සමාගමේ වසර 20 සේවය කර පළපුරුද්දක් ඇති දේවින්ද ට දිනක් ඔහුගේ ප්‍රධානියා ඔහු අමතා මෙසේ පවසන ලදි.

දේවින්ද, අපට ලොකු ඇණවුමක් ඇවිල්ලා. කර්මාන්ත ශාලාව ඇතුලේ එය ඉටුකිරීමට තරම් ධාරිතාව මදි. ඔයාට පුළුවන්නම් මැෂින් ටිකක් දාලා මෙයින් කොටසක් මහන ව්‍යාපාරයක් පටන් ගන්න.

මෙම ව්‍යාපාරය ඇරඹීම සඳහා දේවින්දගෙ මිතුරෙකු වන කාවින්ද සමග සාකච්ඡා කරන ලදි. පසුව ඔහු රු. 500,000 ක් ද දේවින්දගේ බිරිඳ වන අප්සරා හා දේවින්ද රු. 250,000 බැගින් යොදා දේවින්දගේ නිවසේ ම කොටසක දේවින්ද කාවින්ද හා අප්සරා 5 : 3 : 2 අනුපාතයට ලාභ අලාභ බෙදා ගැනීමේ පදනම මත "ෂා ෆැෂන්" නමින් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි.

ඒ සඳහා රු. 40,000 බැගින් මුදලට මහන මැෂින් 10 ක් මිලදී ගත්හ. රු. 45,000 බැගින් පොලි රහිතව මාස 9 කින් ගෙවීමට සිංගර් ආයතනයෙන් මැෂින් 5ක් ගන්නා ලදි

வணிகக் கல்வியும் கணக்கீடும்

මේ ව්‍යාපාරය සඳහා මුදලින් කළ ගෙවීම් පහත දැක්වේ.

| | |
|---|---|
| රෙදි සඳහා | 700,000 |
| නූල් හා ඉදිකටු | 25,000 |
| වැටුප් | 150,000 |
| අතිකාල දීමනා | 60,000 |
| විදුලිය ගාස්තු | 22,000 |
| දුරකථන ගාස්තු | 15,000 |
| ප්‍රවාහන ගාස්තු | 23,000 |
| නිවස සඳහා කුලිය | 5,000 |
| විකුණුම් ආදායම | 1,100,000 |

1. මොවුන්ට ආරම්භ කළ හැකි ව්‍යාපාර සංවිධාන වර්ගය නම් කරන්න.
2. අරමුණ හා අයිතිය අනුව වර්ග කිරීමේ දී, මෙම ව්‍යාපාරය අයත් වන වර්ගය වෙන වෙනම නම් කරන්න.
3. ආරම්භ කල ව්‍යාපාරය කුමන සංවිධාන වර්ගයකට අයත් වුවත් එය සාර්ථක කර ගැනීම සඳහා මූලික වශයෙන් පිළියෙල කළ යුත්තේ කුමක් ද?
4. අ. "ෂා ෆැෂන්" යනුවෙන් ලියාපදිංචි කරන ලද්දේ කුමන නීතිය යටතේ ද?
   ආ. එසේ ලියාපදිංචි කළ යුතතේ කිනම් ආයතනයක ද?
5. මොවුන්ට ව්‍යාපාරය කිරීමට ඇති ශක්තින් 2ක් නම් කරන්න
6. "ෂා ෆැන්න්" හි ආරම්භක ප්‍රාග්ධනය කියද?
7. මෙම ව්‍යාපාරයේ ලාභය කියද?
8. අප්සරාගේ ලාභ කොටස කියද ?
9. සිංගර් ආයතනයෙන් ලබා ගත් මැෂින් සඳහා ගෙවීමට ඇති මාසික ණය වාරිකය කියද ?
10 මෙම ව්‍යාපාරයේ ප්‍රාග්ධනයට ශුද්ධ ලාභ අනුපාතය කියද?

(ලකුණු 02 x 10 = 20 යි)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න **සියල්ලටම** පිළිතුරු සපයන්න.)

02. (i) නිෂ්පාදනයේ ප්‍රධාන අරමුණ කුමක් ද?

(ලකුණු 02 යි)

(ii) භාණ්ඩ හුවමාරු ක්‍රමයේ පැවති දුර්වලතා 4ක් නම් කරන්න.

(ලකුණු 02 යි)

(iii) සපත්තු නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන පවන් ඒ සඳහා ඔහු විසින් සකස් කරන ලද ව්‍යාපාර සැලැස්මෙන් උපුටා ගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

මාසයකදී නිපදවීමට අපේක්ෂිත සපත්තු යුගල ඒකක 500

ඇස්තමේන්තුගත මාසික පිරිවැය......

| | |
|---|---|
| සම් | 50,000 |
| නූල් හා ගම් | 20,000 |
| සපත්තු මෝස්තර නිර්මාණකරුගේ ගාස්තුව | 8,000 |
| විදුලිය, දුරකථන, වෙනත් වියදම් | 4,000 |
| ගොඩනැගිලි කුලී | 6,000 |

සපත්තු යුගලයක කුලිය රු. 75

(අ) ඇස්තමේන්තුගත මාසික මුළු නිෂ්පාදන පිරිවැය සොයන්න.

(ආ) නිපදවන එක් සපත්තු යුගලයක නිෂ්පාදන පිරිවැය සොයන්න.

(ඉ) අපේක්ෂිත ලාභය පිරිවැයෙන් 20% නම් පවන් එක් සපත්තු යුගලක් විකිණීමට ලකුණු කළ යුතු මිල කීය ද?

(ලකුණු 02 x 03 = 06 යි)

03. (i) මූල්‍ය සමාගමක් යනු කුමක් ද?

(ii) ණයකාඩ් (Credit Card) භාවිතයෙන් පාරිභෝගිකයාට ඇති විය හැකි අවාසි 2ක් සඳහන් කරන්න.

(iii) ව්‍යාපාර සංවිධාන සඳහා ලියාපදිංචියට අමතරව විශේෂ බලපත්‍ර ලබා ගැනීම තුළින් ව්‍යාපාරයට ලැබෙන ප්‍රතිලාභ මොනවාද ?

(iv) සමුපකාර සමිති වල පෞද්ගලික අංශයට වඩා කැපී පෙනෙන ලක්ෂණ පවතී. ඒවා 2ක් ගෙන හැර දක්වන්න.

(v) ප්‍රධාන රක්ෂණ මූලධර්ම නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න.

(ලකුණු 02 x 05 = 10 යි)

## II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න **සියල්ලටම** පිළිතුරු සපයන්න.)

04. අ. පහත සඳහන් ගනුදෙනු,

වත්කම් = ප්‍රාග්ධනය + වගකීම් සමීකරණයට ඇතුළත් කර පෙන්වන්න.

1. ප්‍රාග්ධනය යෙදුවා රු. 500,000
2. බැංකු ණය ගෙව්වා රු. 40,000
3. රක්ෂණ ගාස්තු ගෙව්වා රු. 5,000
4. කොමිස් මුදලක් ලැබුණා රු. 3,000
5. මෝටර් රථයක් ගත්තා රු. 1,000,000

(ලකුණු 2.5 යි)

ආ. පහත සඳහන් ගනුදෙනුවලට අදාල උපයෝගි පොත හා ඊට අදාල මුලාශ්‍ර ලිපිය නම් කරන්න.

1. ප්‍රාග්ධනය ලෙස රු. 550,000 ක් මුදල් යෙදීම.
2. රු. 15,000ක භාණ්ඩ තොගයක් අශානිගෙන් ණයට ගැනීම.
3. නාමල් ට විකුණු රු. 20,000 ක භාණ්ඩ වලින් රු. 5,000 ක භාණ්ඩ නරක් වී තිබී ආපසු එවා තිබීම.
4. යන්ත්‍රයක් රු. 50,000 සුනිමල්ගෙන් ණයට ගැනීම.
5. සිරිල් පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 10,000 ක් ව්‍යාපාරයෙන් ගැනීම.

(ලකුණු 2.5 යි)

ඉ. සේපාලිකාගේ ව්‍යාපාරයේ 2012 ජනවාරි මාසයට අදාල සුළු වියදම් මෙසේය.

| | | |
|---|---|---|
| 2012.01.01 | අත ඉතිරි | 92 |
| | අග්‍රිමය ප්‍රතිපූරණය කළා | 1908 |
| 06 | මුද්දර ගත්තා | 270 |
| 12 | ලොරි කුලි ගෙව්වා | 280 |
| 18 | යතුරු ලියන කඩදාසි | 150 |
| 21 | විදුලි පණිවුඩ | 170 |
| 24 | ගෙනඒමේ කුලි | 300 |
| 26 | සංග්‍රහ ගාස්තු | 285 |
| 29 | කිරා ට ගෙව්වා | 350 |
| 30 | ලිපිද්‍රව්‍ය ගාස්තු ගෙව්වා | 165 |
| 31 | මේසයක් ගත්තා | 450 |

තැපැල්, ගමන්, ලිපිද්‍රව්‍ය හා විවිධ යන විශ්ලේෂණ තිරු සහිත සුළු මුදල් පොතක ඉහත ගනුදෙනු ලියා දක්වන්න.

(ලකුණු 05 යි)

අටවන පිටුව බලන්න

05\. අ. 2012.01.31 දිනට අනුරාධගේ ව්‍යාපාරයේ මුදල් පොතේ පරිදි බැංකු ශේෂය රු. 6,500 කි. එදින ලද බැංකු ප්‍රකාශයේ ශේෂය මීට අසමාන වූ හෙයින් වෙනසට හේතු මෙසේ සොයා ගන්නා ලදි.

1. රු. 7,000 ක් වටිනා චෙක්පත් මෙතෙක් බැංකු ගිණුමට බැර වී නොමැත.
2. නිකුත් කරන ලද රු. 8,500 ක චෙක්පත් මෙතෙක් බැංකුවට ඉදිරිපත් කර නැත.
3. බැංකුව විසින් සෘජුව ගිණුම් හිමියා හර කරන ලද රු. 2,000 ගෙවල් කුලි වියදම මුදල් පොතේ සටහන් කර නොමැත.
4. රු. 3,500 ක් වූ පොලී ආදායම බැංකු ගිණුමට බැර කර ඇත.

ඉහත සඳහන් තොරතුරු ඇසුරෙන් මුදල් පොත සංශෝධනය කර 2012.01.31 දිනට බැංකු සැසඳුම් පතක් පිළියෙල කරන්න.

(ලකුණු 05 යි)

ආ. 2011 දෙසැම්බර් 31 දිනට සකස් කරන ලද ශේෂ පිරික්සුම සමාන නොවූ ද මතු සඳහන් වැරදි සොයා ගන්නා ලදි.

1. සාරංග ට ණයට විකුණුම් රු. 10,000 පොත්වල දෙවරක් සටහන් වීම.
2. ගෙවූ බැංකු ණය පොලිය රු. 2,000 මුදල් පොතේ නිවැරදිව සටහන් කර, බැංකු ණය ගිණුමට හර කර තිබීම.
3. රු. 4,000 ක රක්ෂණ ගාස්තුව මුදල් පොතේ පමණක් සටහන් කර තිබීම.
4. ඒ. බී. සිල්වාට ගෙවූ රු. 7,500 ඔහුගේ ගිණුමේ රු. 8,000 ක් ලෙස සටහන් කොට ඇති අතර බී. සී. සිල්වාට ගෙවූ රු. 3,500 ඔහුගේ ගිණුමේ රු. 3,000 ලෙස සටහන් කොට ඇත.
5. තිලකා ට ණයට විකුණු භාණ්ඩ වලින් රු. 2,500 ක භාණ්ඩ ආපසු හරවා එවා තිබීම පොත් වල සටහන් කිරීම මගහැරී ඇත.
6. ණයහිමියෙකු වූ නාරද ට ගෙවූ රු. 10,000 ක මුදල නාරදගේ ගිණුමේ රු. 1,000 ක් ලෙස සටහන් වී ඇත.

ඉහත දැක්වෙන වැරදි අතර, ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේ දී අනාවරණය නොවන වැරදි හතරක් දක්වා ඇත. එම වැරදි පමණක් තෝරාගෙන නිවැරදි කිරීමට අදාල ජ'නල් සටහන් පෙන්වන්න.

(ලකුණු 05 යි)